(නවවැනි පාර්ලිමේන්තුව -  පස්වැනි සභාවාරය)

අංක 12. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 මාර්තු 21 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොණ්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **හරීන් ප්‍රනාන්දු මහතා,** සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹෙපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රේමලාල් ජයසේකර මහතා,** වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැව්ලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු  සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු  ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු  ජයන්ත කැටගොඩ මහතා

ගරු  නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  උදයන කිරිදිගොඩ මහතා

ගරු  ලලිත් වර්ණ කුමාර මහතා

ගරු  ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු  කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු  වේලු කුමාර් මහතා

ගරු  කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු  නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු  මනෝ ගනේෂන් මහතා

ගරු  උදය ගම්මන්පිල මහතා

ගරු  (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු  උදයකාන්ත ගුණතිලක මහතා

ගරු  කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු  යදාමිණී ගුණවර්ධන මහතා

ගරු  (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු  එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු  මිලාන් ජයතිලක මහතා

ගරු  නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු  පියංකර ජයරත්න මහතා

ගරු  (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු  (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු  දයාසිරි ජයසේකර මහතා

ගරු  එම්. එස්. තවුෆික් මහතා

ගරු  කුලසිංහම් තිලීපන් මහතා

ගරු  ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු  ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු  (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු  පලනි දිගම්බරම් මහතා

ගරු  දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු **නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ්** මහතා

ගරු **එස්. සී. මුතුකුමාරණ** මහතා

ගරු **මොහමඩ් මුසම්මිල්** මහතා

ගරු **නීතිඥ වසන්ත යාපාබණ්ඩාර** මහතා

ගරු **පාඨලී චම්පික රණවක** මහතා

ගරු **නිපුණ රණවක** මහතා

ගරු **(පූජ්‍ය) අතුරලියේ රතන හිමි**

ගරු **බී. වයි. ජී. රත්නසේකර** මහතා

ගරු **කුමාරසිරි රත්නායක** මහතා

ගරු **සී. බී. රත්නායක** මහතා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල** මහතා

ගරු **ඉෂාක් රහුමාන්** මහතා

ගරු **හර්ෂණ රාජකරුණා** මහතා

ගරු **ගුණතිලක රාජපක්ෂ** මහතා

ගරු **චමල් රාජපක්ෂ** මහතා

ගරු **(වෛද්‍ය) තිලක් රාජපක්ෂ** මහතා

ගරු **මහින්ද රාජපක්ෂ** මහතා

ගරු **උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ** මහතා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන්** මහතා

ගරු **එම්. රාමේෂ්වරන්** මහතා

ගරු **ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම්** මහතා

ගරු **නිමල් ලාන්සා** මහතා

ගරු **වරුණ ලියනගේ** මහතා

ගරු **ගාමිණී ලොකුගේ** මහතා

ගරු **ගාමිණී වලේබොඩ** මහතා

ගරු **නයන වාසලතිලක** මහතා

ගරු **ඉරාන් වික්‍රමරත්න** මහතා

ගරු **රාජිකා වික්‍රමසිංහ** මහත්මිය

ගරු **සී. වී. විග්නේෂ්වරන්** මහතා

ගරු **රෝහිණී කුමාරි විජේරත්න** මහත්මිය

ගරු **එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන** මහතා

ගරු **නීතිඥ මධුර විතානගේ** මහතා

ගරු **හේෂා විතානගේ** මහතා

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා , කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ගරු කථානායකතුමා විසින් 2024 මාර්තු 20 දින 'සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)' සහ 'එකතු කළ අගය මත බදු (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නියොජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIV කොටස;

(ii) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLI කොටස;

(iii) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXXIX කොටස; සහ

(iv) 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXVII කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු කංචන විජේසේකර මහතා වෙනුවෙන් එම කාරක

සභාවේ සාමාජික මන්ත්‍රී ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවේ උපදෙස් සහ නිර්දේශ මත එම පනතේ 5 සහ 6 වගන්ති සමඟ කියවිය යුතු 7 වගන්තිය යටතේ ඛනිජතෙල් නිෂ්පාදන බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 10 දිනැති අංක 2340/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2021 වර්ෂය සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iii) 2021 වර්ෂය සඳහා ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව;

(iv) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(v) 2021 වර්ෂය සඳහා යාපනය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(vi) 2022 වර්ෂය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2022 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) ගම්පහ, ඉහලගම, අංක 155 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ.පී.කේ. දයානන්ද මහතාගෙන් ලැබුණු 2023.12.11 දිනැති පෙත්සම ගරු අජිත් මාන්නප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාතලේ, තැන්න, මුවගල හංදිය, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ජී. නන්දා සෝමලතා මහත්මියගෙන් ලැබුණු 2023.11.14 දිනැති පෙත්සම;

(ii) උකුවෙල, නාගොල්ල, අංක 200/3 දරන ස්ථානයෙහි පදිංචි අනුර උපතිස්ස මල්තුංග මහතාගෙන් ලැබුණු 2024.02.28 දිනැති පෙත්සම;

(iii) මාතලේ, කිවුල, අංක 08 දරන ස්ථානයෙහි පදිංචි ජී.ජී. සනත් චන්ද්‍රකුමාර මහතාගෙන් ලැබුණු 2023.11.23 දිනැති පෙත්සම;

(iv) බෙලිගමුව, වළකඹුර, අංක 142, දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී.සී. හර්ෂන් විජේරත්න මහතාගෙන් ලැබුණු 2023.10.24 දිනැති පෙත්සම;

(v) මාතලේ, මැටිහක්ක, රංමුතුගම යන ලිපිනයෙහි පදිංචි පී.කේ.ජී. විජේරත්න මහතාගෙන් ලැබුණු 2024.02.12 දිනැති පෙත්සම; සහ

(vi) නාලන්ද, හෝමාපොල, පී 204, දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. කුඩාමැණිකේ මහත්මියගෙන් ලැබුණු 2023.11.04 දිනැති පෙත්සම

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(3) මාතලේ, මඩවල උල්පත, මැදිරොද, අංක 95/7, දරන ස්ථානයෙහි පදිංචි බී.ජී. චන්ද්‍රවංශ බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2023.09.24 දිනැති පෙත්සම ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) කරන්දෙණිය, බාන්වැල්ගොඩ යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. මෛත්‍රීසේන මහතාගෙන් ලැබුණු 2023.12.17 දිනැති පෙත්සම;

(ii) හික්කඩුව, පතන, සමර් සිටි, අංක 17 දරන ස්ථානයෙහි පදිංචි අයි.ජී.එස්.ඩබ්ලිව්. රවීන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2023.11.28 දිනැති පෙත්සම;සහ

(iii) අම්බලන්ගොඩ, තිලකපුර, ජන උදාන ගම්මානය, අංක. 101 ඒ දරන ස්ථානයෙහි පදිංචි සුදත් ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2024.02.08 දිනැති පෙත්සම

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**5. බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන):** මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2024 අප්‍රේල් 09 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2024 අප්‍රේල් 01 සඳුදා සහ අප්‍රේල් 02 අඟහරුවාදා යන දිනයන් පාර්ලිමේන්තුව රැස්වන දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2024 අප්‍රේල් 01 සඳුදා සහ අප්‍රේල් 02 අඟහරුවාදා දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු ඩී. වීරසිංහ මහතා, ගරු කුමාරසිරි රත්නායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**10. කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංගත්වය:** විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2024 මාර්තු 19),— "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ලෙස සම්මත කර ගන්නා බවට විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැඩි විරෝධතා ඉදිරිපත් කර සිටිය දී එම විරෝධතා නොසලකා හරිමින් එකී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට පටහැනි ලෙස ආණ්ඩු පක්ෂයට එම පනත් කෙටුම්පතේ යම් වගන්තීන් සම්මත කරවා ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

විශේෂයෙන්ම,

(අ) එම පනත් කෙටුම්පතේ 13 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව එම වගන්තිය විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කරවා ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබිය දී එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ආ) එම පනත් කෙටුම්පතේ 17 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම වගන්තිය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉවත් කර දමන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් එම වගන්තිය ඒ ආකාරයෙන්ම සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඇ)එම පනත් කෙටුම්පතේ 20, 33(6), 34(1), 35(1) වගන්තීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගතයුතු බවත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම්, ශ්‍රේෂ්ඨාධිකරණය සිදු කළ සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම නිර්දේශ කරන ලද සංශෝධන නොකර සරල බහුතරයකින් එම වගන්තීන් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඈ) එම පනත් කෙටුම්පතේ 21 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවටත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත් සහ එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉදිරිපත් කරන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් ඒ ආකාරයෙන් කටයුතු නොකර එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඉ) එම පනත් කෙටුම්පතේ 22 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව සංශෝධන සිදු කළ යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඊ) එම පනත් කෙටුම්පතේ 31 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පරිදි සංශෝධන සිදු කළ යුතු බවටත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

මේ බව තහවුරු කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ද එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් සම්මත කර ගැනීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව කටයුතු කර නොමැති බවත්, එසේ කටයුතු නොකිරීම නිසා දැනට එම පනත පවතින ආකාරයට එය සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය ඡන්ද ප්‍රමාණය පාර්ලිමේන්තුවේදී ලැබී ඇත් ද යන්න පිළිබඳව බලවත් ප්‍රශ්නයක් පැන නැඟී ඇති බවත් කථානායකවරයාට එම කොමිෂන් සභාව විසින් යොමුකරන ලද 2024 පෙබරවාරි 08 දිනැති ලිපියේ දක්වා ඇති හෙයින් ද;

එසේම, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියැවීමේ දී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විසින් පැහැදිලිවම බෙදීමක් ඉල්ලා සිටිය දී එම ඉල්ලීම නොසලකා බෙදීමක් ලබා නොදී එම පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියවීම බෙදීමකින් තොරව සම්මත කර ගැනීමට ඉඩ හැරීමෙන් ද;

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ආකාරයට ඇතැම් වගන්තීන් ආණ්ඩු පක්ෂය විසින් සම්මත කර ගෙන ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් ගැඹුරින් සලකා බලන තෙක් එම පනත් කෙටුම්පත නීතියක් බවට පත් කිරීම සඳහා සහතිකය සටහන් නොකරන ලෙසට 2024 පෙබරවාරි 01 වැනි දින පැවති පක්ෂ නායකවරුන්ගේ විශේෂ රැස්වීමේදී විපක්ෂයේ මන්ත්‍රීවරයන් පිරිසක්

කථානායකවරයාගෙන් ඉල්ලා තිබියදීත් එම ඉල්ලීම සැලකිල්ලට නොගෙන එම පනත් කෙටුම්පත නීතිගත කිරීම සඳහා සහතිකය සටහන් කිරීමෙන් ද;

2024 පෙබරවාරි 26 දින පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමේ දී පොලිස්පති ධුරය සඳහා ජනාධිපතිවරයා විසින් නිර්දේශ කර තිබූ නම සලකා බැලූ අවස්ථාවේ දී එසේ නිර්දේශ කරන ලද පුද්ගලයා එම ධුරයට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් සිව් දෙනෙකු පක්ෂව ද, දෙදෙනෙකු විපක්ෂව ද ඡන්දය දී තිබිය දී සහ සාමාජිකයින් දෙදෙනෙකු ඡන්දය දීමෙන් වැළකී සිටිය දී සහ ඒ අනුව එකීනිර්දේශිත නාමය පොලිස්පති ධුරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව අනුමත කර නොතිබිය දී ජනාධිපතිවරයාට ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලද 2024 පෙබරවාරි 26 දිනැති ලිපියේ 4 වන ඡේදයේ,

> "කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ) ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැති බැවින් නීතිය ඉදිරියේ ඡන්දය දීමෙන් වැළකී සිටීම විපක්ෂ වීමක් ලෙස සලකනු ලබන්නේ නම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ)(5) ව්‍යවස්ථාව අනුව උක්ත ප්‍රශ්නය සම්බන්ධයෙන් සම සමව ඡන්දය ලැබුණා සේ සලකන්නේ නම් සභාපතිවරයා වශයෙන් මාගේ තීරක ඡන්දය ද පක්ෂව ලබා දෙන බව කාරුණිකව දන්වමි."

යනුවෙන් සඳහන් කරමින් එසේ ජනාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද පුද්ගලයා නීති විරෝධී ලෙසත්, ව්‍යවස්ථා විරෝධී ලෙසත් පොලිස්පති ධුරයට පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට ව්‍යවස්ථා විරෝධී ලෙසත් නීති විරෝධී ලෙසත් අනුබල දීමෙන් ද, සහාය දැක්වීමෙන් ද, අනුග්‍රහය දැක්වීමෙන් ද;

කථානායකවරයා විසින් පාර්ලිමේන්තු කටයුතුවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බරපතල ලෙස උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති හෙයින් ද;

පාර්ලිමේන්තුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යන උත්තරීතර ආයතන පිළිබඳව මහජන විශ්වාසය කඩවන ලෙස කථානායකවරයා කටයුතු කර ඇති හෙයින් ද;

කථානායකවරයා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග බරපතල ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

කථානායකවරයා පක්ෂග්‍රාහීව කටයුතු කරන බව පැහැදිලිවම ප්‍රදර්ශනය කරමින් කථානායක ධුරයේ ස්වාධීනත්වය ද, ගෞරවය ද, බරපතල ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

අපක්ෂපාතීව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීමට බැඳී සිටින කථානායකවරයා විසින්ම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද කඩකර ඇති හෙයින් ද; සහ

කථානායක ධුරයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පැහැර හැර ඇති හෙයින්;

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා කෙරෙහි තවදුරටත් විශ්වාසයක් නොමැති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා.27/2024]

(පූ.භා. 11.23 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.11 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු නිමල් ලාන්සා මහතා, ගරු ජේ. සී. අලවතුවල මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.20 ට ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.37 ට ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.28 ට ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.17 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 75; විරුද්ධව 117; යනුවෙන් බෙදී, එය නිෂ්ප්‍රභ විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය අසූහත් දෙනෙක් (187) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Pavithradevi Wanniarachchi | No |
| G 002. Nimal Siripala De Silva | No |
| G 003. Chamal Rajapaksa | No |
| G 004. Mahinda Rajapaksa | No |
| G 005. Prasanna Ranatunga | No |
| G 007. Dinesh Gunawardena | No |
| G 009. Douglas Devananda | No |
| G 010. Bandula Gunawardana | No |
| G 011. Mahinda Amaraweera | No |
| G 012. Wijeyadasa Rajapakshe | No |
| G 013. Harin Fernando | No |

| | |
|---|---|
| G 014. Ramesh Pathirana | No |
| G 015. M. U. M. Ali Sabry | No |
| G 016. Vidura Wickramanayaka | No |
| G 017. Kanchana Wijesekera | No |
| G 019. Tiran Alles | No |
| G 020. Nalin Fernando | No |
| G 022. Jeewan Thondaman | No |
| G 023. Ranjith Siyambalapitiya | No |
| G 024. Jagath Pushpakumara | No |
| G 025. Dilum Amunugama | No |
| G 026. Mohan Priyadarshana De Silva | No |
| G 027. Janaka Wakkumbura | No |
| G 028. Shehan Semasinghe | No |
| G 029. Kanaka Herath | No |
| G 030. Thenuka Vidanagamage | No |
| G 031. Pramitha Bandara Tennakoon | No |
| G 032. Lasantha Alagiyawanna | No |
| G 033. Rohana Dissanayaka | No |
| G 034. Premalal Jayasekara | No |
| G 035. Arundika Fernando | No |
| G 037. Lohan Ratwaththe | No |
| G 038. Tharaka Balasuriya | No |
| G 039. Indika Anuruddha Herath | No |
| G 040. Siripala Gamalath | No |
| G 041. Anuradha Jayaratne | No |
| G 042. S. Viyalanderan | No |
| G 043. D.V. Chanaka | No |
| G 044. Sisira Jayakody | No |
| G 045. Piyal Nishantha De Silva | No |
| G 046. Prasanna Ranaweera | No |
| G 047. D. B. Herath | No |
| G 048. Shasheendra Rajapaksa | No |
| G 049. Seetha Arambepola | No |
| G 051. K. Kadder Masthan | No |
| G 052. Asoka Priyantha | No |
| G 053. A. Aravindh Kumar | No |

| | |
|---|---|
| G 054. Geetha Samanmale Kumarasinghe | No |
| G 055. Suren Raghavan | No |
| G 056. Diana Gamage | No |
| G 057. Sivanesathurai Santhirakanthan | No |
| G 058. Chamara Sampath Dasanayake | No |
| G 059. Anupa Pasqual | No |
| G 060. Johnston Fernando | No |
| G 061. S. B. Dissanayake | No |
| G 062. Gamini Lokuge | No |
| G 063. Vajira Abeywardena | No |
| G 064. Janaka Bandara Tennakoon | No |
| G 065. C. B. Rathnayake | No |
| G 066. Keheliya Rambukwella | No |
| G 067. S. M. Chandrasena | No |
| G 068. Mahindananda Aluthgamage | No |
| G 069. Rohitha Abeygunawardana | No |
| G 071. Sarath Weerasekara | No |
| G 072. Wimalaweera Dissanayaka | No |
| G 075. Kapila Athukorala | No |
| G 076. Gayashan Nawananda | No |
| G 077. S. M. M. Muszhaaraff | No |
| G 078. S. C. Muthukumarana | No |
| G 079. Jayantha Ketagoda | No |
| G 080. Sampath Athukorala | No |
| G 081. Thisakutti Arachchi | No |
| G 082. U. K. Sumith Udukumbura | No |
| G 083. Pradeep Undugoda | No |
| G 084. Sanjeeva Edirimanna | No |
| G 085. Akila Ellawala | No |
| G 086. Jagath Kumara Sumithraarachchi | No |
| G 087. Karunadasa Kodithuwakku | No |
| G 088. Nalaka Bandara Kottegoda | No |
| G 089. Udayakantha Gunathilaka | No |
| G 090. Kokila Gunawardene | No |
| G 091. Milan Jayathilake | No |
| G 092. Kulasingam Dhileeban | No |

| | |
|---|---|
| G 093. Sudarshana Denipitiya | No |
| G 094. Isuru Dodangoda | No |
| G 095. Premnath C. Dolawatte | No |
| G 097. Muditha Prishanthi | No |
| G 098. Sudath Manjula | No |
| G 099. Mayadunna Chinthaka Amal | No |
| G 100. Nipuna Ranawaka | No |
| G 101. Kumarasiri Rathnayaka | No |
| G 102. Gunathilaka Rajapaksha | No |
| G 103. Upul Mahendra Rajapaksha | No |
| G 104. M. Rameshwaran | No |
| G 105. Rajika Wickramasinghe | No |
| G 106. M. W. D. Sahan Pradeep Withana | No |
| G 107. Madhura Withanage | No |
| G 108. D. Weerasingha | No |
| G 109. Samanpriya Herath | No |
| G 110. Sagara Kariyawasam | No |
| G 111. Yadamini Gunawardena | No |
| G 112. Manjula Dissanayake | No |
| G 113. Ranjith Bandara | No |
| G 114. Jayantha Weerasinghe | No |
| G 115. Marjan Faleel | No |
| G 116. Lalith Varna Kumara | No |
| O 001. Rishad Bathiudeen | Yes |
| O 002. Rajitha Senarathne | Yes |
| O 003. Imthiaz Bakeer Markar | Yes |
| O 004. Tissa Attanayake | Yes |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. Gayantha Karunatilleka | Yes |
| O 007. Lakshman Kiriella | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 010. Patali Champika Ranawaka | Yes |
| O 011. Palany Thigambaram | Yes |
| O 012. Mano Ganesan | Yes |
| O 015. G.L. Peiris | Yes |
| O 017. A. L. M. Athaullah | No |

| | |
|---|---|
| O 022. Kabir Hashim | Yes |
| O 023. Thalatha Athukorala | Yes |
| O 025. Sarath Fonseka | Yes |
| O 026. Harsha De Silva | Yes |
| O 028. R. M. Ranjith Madduma Bandara | Yes |
| O 029. Dilip Wedaarachchi | Yes |
| O 030. Niroshan Perera | Yes |
| O 031. Eran Wickramaratne | Yes |
| O 032. J. C. Alawathuwala | Yes |
| O 033. John Seneviratne | No |
| O 037. Vijitha Herath | Yes |
| O 038. Selvarajah Kajendren | Yes |
| O 041. Angajan Ramanathan | No |
| O 042. Vadivel Suresh | No |
| O 044. Ashok Abeysinghe | Yes |
| O 047. Ajith Mannapperuma | Yes |
| O 048. Buddhika Pathirana | Yes |
| O 049. M. S. Thowfeek | Yes |
| O 050. Nalin Bandara Jayamaha | Yes |
| O 051. Hector Appuhamy | Yes |
| O 052. Thushara Indunil Amarasena | Yes |
| O 053. Dilan Perera | Yes |
| O 054. Wimal Weerawansa | Yes |
| O 055. Piyankara Jayaratne | No |
| O 056. Vasudeva Nanayakkara | Yes |
| O 057. Harini Amarasuriya | Yes |
| O 058. Govindan Karunakaram | Yes |
| O 061. Velu Kumar | Yes |
| O 062. Kavinda Heshan Jayawardhana | Yes |
| O 063. Mayantha Dissanayake | Yes |
| O 064. K. Sujith Sanjaya Perera | Yes |
| O 065. S. M. Marikkar | Yes |
| O 066. Imran Maharoof | Yes |
| O 068. Harshana Rajakaruna | Yes |
| O 069. Rohini Kumari Wijerathna | Yes |
| O 070. Hesha Withanage | Yes |

| | |
|---|---|
| O 071. Waruna Liyanage | Yes |
| O 072. M. Udayakumar | Yes |
| O 073. Jayarathna Herath | Yes |
| O 075. Chandima Weerakkody | Yes |
| O 076. Dayasiri Jayasekara | Yes |
| O 077. Sivagnanam Shritharan | Yes |
| O 078. M. A. Sumanthiran | Yes |
| O 079. Charles Nirmalanathan | Yes |
| O 080. S. Rajaputhiran Rasamanickam | Yes |
| O 081. W. H. M. Dharmasena | Yes |
| O 082. Kins Nelson | Yes |
| O 083. Rohana Bandara | Yes |
| O 084. Nayana Wasalathilaka | Yes |
| O 085. Udaya Gammanpila | Yes |
| O 086. Nalaka Godahewa | Yes |
| O 087. Channa Jayasumana | Yes |
| O 089. Nimal Lanza | No |
| O 090. Jayantha Samaraweera | Yes |
| O 091. B. Y. G. Rathnasekara | Yes |
| O 092. Sarathie Dushmantha | Yes |
| O 094. Lalith Ellawala | Yes |
| O 096. K. P. S. Kumarasiri | Yes |
| O 097. Upul Galappaththi | Yes |
| O 098. Shan Vijayalal De Silva | Yes |
| O 100. Thavaraja Kalai Arasan | Yes |
| O 101. S. Jagath Samarawickrama | No |
| O 106. Wasantha Yapabandara | Yes |
| O 107. Thilak Rajapakshe | Yes |
| O 108. Gamini Waleboda | Yes |
| O 109. Weerasumana Weerasinghe | Yes |
| O 110. Gevindu Cumaratunga | Yes |
| O 111. Charitha Herath | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (05) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Susil Premajayantha | No |

| | |
|---|---|
| Vijitha Berugoda | No |
| H. Nandasena | No |
| A. H. M. Fowzie | No |
| V. Radhakrishnan | Yes |

(අ.භා. 4.47 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

**11. කල් තැබීම**: "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.00 පසු කර තිබුයෙන් අ.භා. 5.11ට කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා, අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 මාර්තු 22 සිකුරාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේය.